සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ...................................................................................... විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01) සම්බුද්ධත්වයෙන් අනතුරුව ලෝක සත්වයාගේ හිතසුව පිණිස දහම් දෙසීම සඳහා බුදුරජාණන් වහන්සේට ආරාධනා කරනු ලැබුයේ,
(1) සහම්පති මහා බ්‍රහ්මයා ය. (2) සටීකාර බ්‍රහ්මයා ය.
(3) ශක්‍ර දේවේන්ද්‍රයා ය. (4) සතරවරම් දෙවිවරු ය.

(02) බුද්ධත්වයෙන් අනතුරුව ඇසතු බෝ රුක මූලයෙහි සහ ඒ අවට ස්ථානයන්හි සති හතක් ගත කළ බුදුරජාණන් වහන්සේ අභිධර්මය මෙනෙහි කරනු ලැබුයේ,
(1) පළමුවන සතියේදී ය. (2) දෙවන සතියේදී ය.
(3) තුන්වන සතියේදී ය. (4) සතරවන සතියේදී ය.

(03) සම්බුදු සසුනෙහි පළමුව බුදුන් හා දහම් සරණ ගිය උපාසකවරුන් බවට පත් වූයේ,
(1) උපක ආජීවකයා ය. (2) තපස්සු හා භල්ලුක යන දෙදෙනා ය.
(3) යසකුල පුත්‍රයා ය. (4) බරණැස් සිටුතුමා ය.

(04) බුදුරජාණන් වහන්සේ අනන්ත ලක්ඛණ සූත්‍රය දේශනා කරනු ලැබුයේ,
(1) පංචවග්ගීය භික්ෂූන් වහන්සේලාට ය. (2) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය.
(3) ජටිල සහෝදරයින්ට ය. (4) භද්‍ද වග්ගිය කුමාරවරුන්ට ය.

(05) කෝලිත හා උපතිස්ස දෙදෙනා බුද්ධ ශ්‍රාවකයින් බවට පත්වීමට පෙර ඔවුන්ගේ ගුරුවරයා වූයේ,
(1) භාර්ගව තවුසා ය. (2) සංජය පිරිවැජියා ය.
(3) සකුළුදායි පිරිවැජියා ය. (4) පොට්ඨපාද පිරිවැජියා ය.

(06) සිංහලේ ''දෙවන මහ කව'' ලෙස හැඳින්වෙන කාව්‍යශේඛරය නම් වූ පද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) වීදාගම මහා මෛත්‍රෙය හිමියන් ය (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය
(3) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය (4) වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් ය

(07) ''තුන්ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට'' යනා දී බුදුගුණ අලංකාරයෙහි දැක්වෙන පද්‍යයෙන් විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ ,

(1) අරහං ගුණයයි. (2) සම්මා සම්බුද්ධ ගුණයයි.
(3) සුගත ගුණයයි. (4) ලෝකවිදූ ගුණයයි.

(08) පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත් සූත්‍ර දේශනා අතර බෞද්ධයින් නිතර භාවිතා කරන තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනාවක් වන්නේ,

(1) රතන සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) ධජග්ග සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(09) බෞද්ධ උපදෙස් රැසක් අපට ලබාදෙන බෞද්ධයාගේ අත්පොත නම් වූ ''ධම්ම පදය'' ඇතුලත් වන්නේ සූත්‍ර පිටකයේ,

(1) දීඝ නිකායට ය. (2) මජ්ඣිම නිකායට ය.
(3) අංගුත්තර නිකායට ය. (4) ඛුද්දක නිකායට ය.

(10) ත්‍රිවිධ ශික්ෂා අතර පඤ්ඤා ශික්ෂාවට අයත් වන ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි අංග දෙක වනුයේ,

(1) සම්මා දිට්ඨි හා සම්මා සංකප්ප ය.
(2) සම්මා වාචා හා සම්මා කම්මන්ත ය.
(3) සම්මා කම්මන්ත හා සම්මා ආජීව ය.
(4) සම්මා සති හා සම්මා සමාධි ය.

(11) ගිහියන් විසින් සමාදන් වන සීලයන් අතර ''මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යන ශික්ෂා පදය ඇතුලත් වන සීලය වන්නේ,

(1) පංච ශීලයයි.
(2) ආජීවඅෂ්ටමක සීලයයි.
(3) නවාංග උපෝසථ සීලයයි.
(4) දස සීලයයි.

(12) අපමහා බෝසතාණෝ නායකයකුව සිට ඥානවන්තව හා සැලසුම් සහගතව කටයුතු කිරීමෙන් තම කණ්ඩායමට සමෘද්ධිය උදාකර දුන් ආකාරය පැහැදිලි කරදෙන ජාතක කතාවක් වූයේ,

(1) ලෝමහංස ජාතකයයි. (2) තේමිය ජාතකයයි.
(3) වට්ටක ජාතකයයි. (4) අපණ්ණක ජාතකයයි.

(13) අතීතයේ සිට පැවත එන වී වගාව හා බැඳුණු ආගමික චාරිත්‍ර අතර ''අග්‍රශෂ්‍ය දානය'' ලෙස හැඳින්වෙනුයේ අස්වැන්නේ පළමු කොටස

(1) දෙවියන් උදෙසා පූජා කිරීම ය.
(2) භික්ෂූන් වහන්සේලා උදෙසා පූජා කිරීම ය.
(3) තෙරුවන් උදෙසා පූජා කිරීම ය.
(4) කිරි මව්වරුන් උදෙසා පූජා කිරීම ය.

(14) ''මිනිසාට අත්විඳීමට සිදුවන සියල්ල සිදුවන්නේ පෙර කරන ලද කර්ම විපාකයනට අනුව යැයි'' පවසන ඔබේ මිතුරෙකුට එහි ඇති අසත්‍ය බව පෙන්වා දීමට ඔබ උපයෝගී කරගනු ලබන බෞද්ධ ඉගැන්වීම වනුයේ,

(1) පටිච්ච සමුප්පාද ධර්මයයි (2) චතුරාර්ය සත්‍ය ධර්මයයි

(3) පංච නියාම ධර්මයයි (4) සතරමහා උපදේශ ධර්මයයි

(15) තමා උපමාකොට වරදින් වැළකීම හෙවත් ''අත්තූපනායික ධර්මය'' පිළිබඳව කරුණු ඇතුළත් බෞද්ධ සූත්‍ර දේශනාව නම්,

(1) වේළුද්වාර සූත්‍රයයි (2) නිබ්බේධිත සූත්‍රයයි

(3) ධම්මික සූත්‍රයයි (4) චූල්ල කම්ම විභංග සූත්‍රයයි

(16) ''තම නිවසට පැමිණි - සැම දෙනහට කුලුණෙනි'' ආදී වූ ආගන්තුක සත්කාර පිළිබඳව උපදෙස් ලබාදෙන පද්‍ය ඇතුළත් වන්නේ,

(1) ලෝකෝපකාරයෙහි ය (2) ලෝවැඩ සඟරාවෙහි ය

(3) සිරිත්මල්දමෙහි ය (4) සිදත් සඟරාවෙහි ය

(17) දුමින්දාගමනය ලෙස හඳුන්වන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලකාවට වැඩම කරවීම සිදු වූයේ,

(1) දුරුතු පොහොය දිනයකදී ය.

(2) පොසොන් පොහොය දිනයකදී ය.

(3) වප් පොහොය දිනයක දී ය.

(4) උඳුවප් පොහොය දිනයකදී ය.

(18) ශාසන ඉතිහාසයේ පවත්වනලද ථේරවාදී බෞද්ධ ධර්ම සංගායනාවන් අතුරින් සතරවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ,

(1) රජගහ නුවර දී ය. (2) විශාලා මහනුවර දී ය.

(3) පැළලුප් නුවර දී ය. (4) අළු විහාරයේ දී ය.

(19) ධන පරිහරණයේ ඉතා වැදගත් සිද්ධාන්තයක් වන ''සමජීවිකතාව'' යනුවෙන් අර්ථවත් වනුයේ,

(1) අයවැය සමව පවත්වා ගැනීමයි.

(2) අය නො ඉක්මවා වැය කිරීමයි.

(3) ධාර්මික කටයුතු සඳහා ධනය වැය කිරීමයි.

(4) නැවත උපයාගත හැකි ලෙස ධනය ආයෝජනය කිරීමයි.

(20) දාන, සීල, භාවනා යනාදී පුණ්‍ය කර්මයන් ඇතුළත් වන්නේ,

(1) දස කුසල්හි ය. (2) දස සක්විතිවත්හි ය.

(3) දස රාජ ධර්මයන්හි ය. (4) දස පුණ්‍ය ක්‍රියාවන්හි ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

(01) ඔබ පන්ති කාමරයේ දී තෙවන වාරයට අදාළව පාසල් පාදක ඇගයීමට අනුව සිදු කළ ධර්ම සාකච්ඡාව ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) ධර්ම සාකච්ඡාව සඳහා ඔබ උපයෝගි කරගත් පෙළපොතෙහි සඳහන් පාඩම කුමක් ද?

(2) ඔබ පන්ති කාමරයෙහි සිදු කළ ධර්ම සාකච්ඡාව මෙහය වූ ආකාරය පිළිබඳව වගන්ති දෙකක් ලියන්න.

(3) මිහිදු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කළේ කිනම් පොහොය දිනක දී ද?

(4) මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ පිරිසෙහි සිටි සාමණේරයන් වහන්සේගේ නම කුමක් ද?.

(5) මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාව තුළ පැවති  ආගමික ඇදහිලි දෙකක් සඳහන් කරන්න.

(6) ස්තූපය හා බුදු පිළිම වහන්සේ ආශ්‍රිතව ගොඩ නැගුණු ගෘහ නිර්මාණ දෙකක් නම් කරන්න.

(7) ත්‍රිවිධ චෛත්‍ය මූලික කරගෙන බිහි වූ පුදපූජා ක්‍රම දෙකක් පෙන්වා දෙන්න.

(8) බුදු දහම ඇසුරින් රචනා වූ ගද්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(9) ධර්ම සාකච්ඡාව සඳහා කරුණු එක්රැස් කර ගැනීමට ඔබ උපයෝගී කරගත් දහම් ග්‍රන්ථ, පුවත් පත්, සඟරා ආදීන්ගෙන් දෙකක් නම් කරන්න.

(10) මෙවැනි ක්‍රියාකාරකමක යෙදීම මඟින් ඔබ තුළ වර්ධනය වූ සමාජ ගුණ දහම් දෙකක් ලියන්න. (මුළු ලකුණු 2x10 = 20)

(02) තුන්ලොවට අග්‍ර වූ මහා කාරුණික බුදුරජාණන් වහන්සේ සියලු ලෝක සත්වයින් දුකින් මුදවාලමින් ''දුකට වෙදාණන්'' වූ සේක,

(1) බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය පිළිඹිබු කෙරෙන අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 02)

(2) බුදුරජාණන් වහන්සේ පෙන්වාදුන් පරිදි උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(3) පාසල් ශිෂ්‍යයකු වශයෙන් අසරණයින්ට පිහිට වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න. (ලකුණු 05)

(03) සතුරු මිතුරු සැමට මෙත් වැඩීම සිතෙහි කුසල ධර්ම වැඩි දියුණු වීමට හේතු වෙයි.

(1) සර්ව සත්ත්ව හිතවාදී බෞද්ධ ආකල්ප ප්‍රකට කරමින් ''සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා'' යනුවෙන් දෙවරක් සඳහන් වන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක් ද? (ලකුණු 02)

(2) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග අතුරින් 3ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) මෛත්‍රී භාවනාව පුහුණු කිරීම තුළින් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)

(04) නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි ආරම්භය සීලයයි. සිල්වත් ජනකායක් වෙසෙන සමාජය ද ශිෂ්ටසම්පන්න වෙයි.

(1) සිල්වත් වීම සඳහා අවශ්‍ය අංග දෙක වන සමාදානය හා විරතිය අර්ථ දක්වන්න. (ලකුණු 02)

(2) වරදින් වෙන්වීමේදී අවධානය යොමුකළ යුතු අංග (ත්‍රිකෝටික පාරිශුද්ධ) තුන පෙන්වා දෙන්න. (ලකුණු 03)

(3) පංචශීලය සුරැකීමෙන් තමාට මෙන්ම සමාජයට ද ලැබෙන යහපත පැහැදිලි කරන්න. (ලකුණු 05)

:(05) ''ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය මහමෙර උසුලනා මිහිකතටත් වැඩිය.''

(1) ඉවසීම ප්‍රගුණ කිරීමෙන් බුදුරජාණන් වහන්සේගේ පැසසුමට ලක් වූ හිමිනම කවුරුන් ද? (ලකුණු 02)

(2) ඔබ දැක ඇති පරිදි ඉවසීම නොමැතිකම නිසා මිනිසාට අත් විඳීමට සිදුව ඇති දුර්විපාක තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ඉවසීමෙන් ලැබෙන ආනිසංස පහක් පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. ඒවා පෙන්වා දෙන්න. (ලකුණු 05)

(06) බුදු දහමෙහි ප්‍රධානතම ඉගැන්වීම චතුරාර්ය සත්‍යයයි. චතුරාර්ය සත්‍යය පිළිබඳව නොදැනීම නිසා සත්ත්වයා සසර සැරි සරයි.

(1) චතුරාර්ය සත්‍යය පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(2) දුකට හේතු වූ තෘෂ්ණාවේ ප්‍රභේද තුන මොනවා ද? (ලකුණු 03)

(3) විභාගය අසමත් වූ ශිෂ්‍යයකුට එය සමත්වීම සඳහා ලබාදෙන උපදෙස් චතුරාර්ය සත්‍යයෙහි ඇතුළත් පියවර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) මවක හා පියකු සිය දරුවන්ගේ දියුණුව වෙනුවෙන් කටයුතු කරන්නේ යම් සේද ඒ ආකාරයෙන්ම ගුරුවරු ද සිසුනගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කරති.

(1) ගුරු සිසු සබඳතා ශක්තිමත් කිරීමෙහි ලා උපදෙස් ලබාදෙන සුප්‍රකට බෞද්ධ සූත්‍ර දේශනාව කුමක් ද? (ලකුණු 02)

(2) බුද්ධ දේශිත සදිසාවන්ට අයත් සමාජ කණ්ඩායම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) ගුරු සිසු සබඳතාව මැනවින් පවත්වාගැනීම උදෙසා සිසුන් විසින් ගුරුවරුනට ඉටුකළ යුතු යුතුකම් පැහැදිලි කරන්න. (ලකුණු 05)